**ධීවර,ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය**

**මධ්‍යම මත්ස්‍ය වෙළඳපල සංකීර්ණය - පෑලියගොඩ**

# Procurement No : CFMC/MT/Admin/2025/VP S

## පෑලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳපල සංකීර්ණයේ රථගාල පවත්වාගෙන යාම සඳහා කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීම සඳහා ලංසු කැඳවීම - 2025

ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය යටතේ කළමනාකරණ භාරයක් මඟින් පාලනය වන පෑලියගොඩ පිහිටි මධ්‍යම මත්ස්‍ය වෙළඳපල සංකීර්ණයේ රථගාල වර්ෂ තුනක කාල සීමාවක් සඳහා පවත්වාගෙන යාමට, පහත සඳහන් අවශ්‍යතාවන් සපුරාලන ලංසුකරුවන්ගෙන් පමණක් පෑලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණ කළමනාකරණ භාරයේ සභාපති විසින්, 2025.10.14 වන දින ප.ව. 02.00 දක්වා මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

2010 වර්ෂයේදී ආරම්භකර ඇති පෑලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳපල සංකීර්ණය, වෙළඳකුටි 154 කින් සමන්විත තොග වෙළඳපළකින්ද, වෙළඳකුටි 128 කින් සමන්විත සිල්ලර වෙළඳපළකින්ද, වාහන 500 ක් පමණ ගාල් කළ හැකි රථගාලකින්ද සමන්විත වන අතර වර්තමානය වන විට විශාල ගණුදෙනුකාරහවතුන් සහ වෙළඳ ප්‍රජාවක් විසින් දෛනිකව භාවිතා කරනු ලබන ඉතා කාර්යබහුල ශ්‍රී ලංකාවේ දැනට පවතින ප්‍රධානතම සහ විශාලතම මසුන් අලෙවි ආයතනය ලෙස ආර්ථික වශයෙන් ශක්තිමත් භාවයට පත්ව ඇත.

1. ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියා පටිපාටිය (NCB) තුළින් මෙම ලංසුකරණය පවත්වනු ලබයි.

ලංසුකරු :-

2. ශ්‍රී ලංකා ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ ආඥා පනත යටතේ හෝ සමාගම් පනත යටතේ ලියාපදිංචි වී තිබිය යුතුය.

3. රාජ්‍ය අංශයට, සංස්ථා/ ව්‍යවස්ථාපිත ආයතනවලට හෝ පිළිගත් පෞද්ගලික ආයතනවලට අයත් රථගාලවල් පවත්වාගෙන යනු ලබන හා පවත්වාගෙන ගොස් ඇති බවට ආසන්නතම වසර 03 ක සේවා පළපුරුද්දක් තිබිය යුතු අතර එයින් එක් රථගාලක හෝ ධාරිතාවය අවම වශයෙන් රථවාහන 400 ක් විය යුතුය.

4. මෙම රථගාල පවත්වාගෙන යාම වෙනුවෙන් මාසිකව ගෙවිය යුතු අවම ගාස්තුව (අවම ලංසු වටිනාකම) රුපියල් ලක්ෂවිස්සක් (රු.2,000,000.00) වේ.

5. ලංසු ඉදිරිපත් කළ යුත්තේ අංක 83/1, මීගහවත්ත පාර, පෑලියගොඩ යන ලිපිනයෙහි පිහිටා ඇති පෑලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳපල සංකීර්ණයේ පරිපාලන කාර්යාලය වෙතින් 2025.10.01 වන දින සිට 2025.10.13 වන දින දක්වා පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා ලංසුකරු විසින් තම ලිපි ශීර්ෂය සහිත වූ ලිපියකින් ඉල්ලුම් කර ලබා ගත් ආකෘති පත්‍ර මඟින් පමණි. තවද එකී කාල සීමාව තුළදී ඕනෑම ලංසුකරුවෙකු වෙත අදාළ ලංසු ලේඛනයන් නොමිලේද පරීක්ෂා කර බැලිය හැක.

6. ලංසු පත් ලබා ගැනීමට පෙර ආපසු නොගෙවනු ලබන රු. 3,500/- ක ලංසු ගාස්තුවක් පෑලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳපල සංකීර්ණයේ කළමනාකරණ භාරයේ ගිණුම් අංක 71446342 දරණ ලංකා බැංකු ගිණුමෙහි තැන්පත් කර අදාළ රිසිට් පත පෑලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳපල සංකීර්ණයේ පරිපාලන කාර්යාලයේ ගිණුම් අංශය වෙත ඉදිරිපත් කර මුදල් කුවිතාන්සියක් ලබා ගත යුතුය.

7. මීට අදාළ පූර්ව ලංසු හමුවක් 2025.10.03 වන දින පෙ.ව. 10.00ට පෑලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳපල සංකීර්ණයේ ප්‍රධාන ශ්‍රවනාගාරයේදී පැවැත්වේ.

8. ලංසු 2026.01.12 දින දක්වා වලංගු විය යුතුය.

9. සියලුම ලංසු සමග 2026.02.09 වන දින දක්වා වලංගු සහ ලංසු ලිපිලේඛන සමග දක්වා ඇති ආකෘතියට අනුකූලවද, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද පිළිගත් කීර්තිමත් වාණිජ බැංකුවකින් ලබාගත් කොන්දේසි විරහිත බැංකු ඇපකරයක් ආකාරයෙන් වන රුපියල් දෙලක්ෂපනස්දහස (රු.250,000/-) ක වටිනාකමින් යුත් ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කළ යුතුය. නැතහොත් එකී වටිනාකම හා සමාන මුදලක් පෑලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳපල සංකීර්ණයේ කළමනාකරණ භාරයේ ගිණුම් අංක 71446342 දරණ ලංකා බැංකු ගිණුමෙහි තැන්පත් කර අදාළ රිසිට් පත පෑලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳපල සංකීර්ණයේ පරිපාලන කාර්යාලයේ ගිණුම් අංශය වෙත ඉදිරිපත් කර එම අංශය වෙතින් නිකුත් කරනු ලබන මුදල් කුවිතාන්සියෙහි මුල් පිටපත ඉදිරිපත් කළ යුතුය.

10. නිසි පරිදි සම්පූර්ණ කරන ලද ලංසු අයදුම්පත්, 2025.10.14 වන දින ප.ව. 02.00 ට පෙර ලැබෙන සේ

**සභාපති**
**පෑලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳපල සංකීර්ණ කළමනාකරණ භාරය,**
**ප්‍රධාන ගණකාධිකාරී කාර්යාලය, දෙවන මහළ,**
**ධීවර,ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය,**
**නව මහලේකම් කාර්යාලය, මාලිගාවත්ත,**
**කොළඹ 10**

යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ, ධීවර,ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශයේ, දෙවන මහලේ මුදල් අංශයේ තබා ඇති ලංසු පෙට්ටියට බහාලීම හෝ කළ යුතුය.

11. ලංසු පත් විවෘත කරනු ලබන අවස්ථාවේ ලංසුකරුට හෝ ඔහු විසින් බලය පැවරූ නියෝජිතයකුට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. 2025.10.14 වන දින ප.ව.02.00 ට ලංසු කැඳවීම අවසන් කළ වහාම ලැබී ඇති ලංසු පත්, ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශයේ දෙවන මහලෙහි පිහිටි ප්‍රධාන ගණකාධිකාරීගේ කාර්යාලයේ දී විවෘත කරනු ලැබේ.

12. මේ සම්බන්ධයෙන් වැඩිමනත් විස්තර පෑලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳපල සංකීර්ණයේ පරිපාලන කාර්යාල දුරකථන අංක 011-3301707 ඇමතීමෙන් ලබා ගත හැක.

**සභාපති**
පෑලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳපල සංකීර්ණ කළමනාකරණ භාරය,
ධීවර,ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය,
නව මහලේකම් කාර්යාලය, මාලිගාවත්ත,
කොළඹ 10.